ඇල්ල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයන්ට අදාල සේවක ඇප මුළු ආයෝජන නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා ඇප ආයෝජන ගිණුම හා සමුච්චිත අරමුදල රු. 18,202 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහනක් මගින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.512,614 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහනක් මගින් නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහනක් මගින් නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු පොලී ආදායම් රු.102,523 ක් ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ගැලපුම් කරමි. |

(ආ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.302,494,340 ක වත්කම් විෂයයන් 02 ක්, රු.516,257 ක වගකීම් විෂයයන් 03 ක් සහ රු.288,161 ක අත්තිකාරම් විෂයයන් 01 විස්තරාත්මක උපලේඛන,ස්ථාවර වත්කම් ලේඛනය,පිළිගත් වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා සහ කාල | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේදී විගණනයට එම සාක්ෂි ඉදිරිපත් කරන බව. |

විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.4** <u>අනුකූල නොවීම</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** 49 හා 52 වගන්ති | හඳුනාගත් අනවසර ඉදිකිරීම් 21 ක් ඉවත් කිරීමට හෝ නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී එම ඉදිකිරීම් වලට අදාලව නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගනිමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 203 | සභාවේ දේපල පිළිබඳව සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති අනුව සභාවේ දේපල සමීක්ෂණය කළ යුතුවේ. | ඉදිරි වසර වලදී එසේ සමීක්ෂණය කරමි. |

**2.** <u>මූල්‍ය සමාලෝචනය</u>

**2.1** <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.101,893 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,662,283 ක් විය.

**2.2** <u>ආදායම් පරිපාලනය</u>

**2.2.1** <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,526,630 | 4,476,585 | 2,919,986 | 6,277,601 | 4,426,630 | 4,426,500 | 2,785,330 | 6,314,316 |
| (ii) | කුලී | 1,370,000 | 1,357,516 | 734,476 | 884,929 | 1,475,200 | 1,245,839 | 792,967 | 853,618 |
| (iii) | වෙනත් ආදායම් | 7,959,500 | 2,645,598 | 2,377,090 | 13,578,640 | 8,890,000 | 7,575,688 | 4,356,550 | 4,855,898 |
| | එකතුව | 12,856,130 | 8,479,699 | 6,031,552 | 20,741,170 | 14,791,830 | 13,248,027 | 7,934,847 | 12,023,832 |

**2.2.2** <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.8,479,699 ක් වූ මුළු ආදායමින් හා කලින් පැවති හිඟ ශේෂයෙන් වර්ෂය අවසාන වන විට රු.20,741,170 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |
| වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු රු.37,654,599 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) <u>උසාවි දඩ</u>** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු.2,087,375ක් විය. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟ උසාවි දඩ අයකර ගනිමි.. |
| **(ආ) <u>මුද්දර ගාස්තු</u>** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.9,958,563 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟ මුද්දර ගාස්තු අයකර ගනිමි. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**කාර්ය සාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| | සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | **ක්‍රියාකාරී සැලැස්ම** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පවත්වාගෙන යන පානීය ජල සැපයුම් ව්‍යාපෘති 27 න් 24 ක් සඳහා ජල මනු සවි නොකර ස්ථාවර ගාස්තුවක් පමණක් අයකර තිබුණි. | සියළුම ජල ව්‍යාපෘති සඳහා ජල මනු සවි කළ යුතුවේ. | දැනට ව්‍යාපෘති 03 කට ජල මීටර් සවි කර ඇත. ඉතිරි ජල ව්‍යාපෘති සඳහා ද ඉදිරියේදී ජල මීටර් සවි කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන එකතුව රු.16,004,560 ක් වූ ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 01 කට අදාල අතිරික්ත කාර්ය මණ්ඩලය 02 ක් විය. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගත යුතුවේ. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 කට අදාලව පුරප්පාඩු 13 ක් විය. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ස්ථානමාරුවී ගිය හා සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.109,165 ක ණය මුදල අය කරගෙන නොතිබුණි. | සේවක ණය අය කරගත යුතුවේ. | එක් සේවකයෙකුගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර,අනෙක් සේවකයාගෙන් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |

3.4 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරමි. |

**4.** **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2019 වර්ෂයේදී කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |